# <u>ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීමේ දී අවශ්‍ය ලියකියවිලි</u>

පැහැදිලි අත් අකුරුන් නිවැරදිව අයදුම්පත්‍රය පිරවිය යුතුයි. අයදුම්පත්‍රය ටිපෙක්ස් කිරීම හෝ කුරුටු ගෑම නොකල යුතුයි .

1. **<u>ඉංග්‍රීසි මාධ්‍යයෙන්</u>** සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (සමදානවිනිශ්චයකරුවරයෙක් හෝ දිවුරුම් කොමසාරිස්වරයෙක් සහතික කළ යුතුයි)
2. ව්‍යාපාරික ස්ථානයට අදාළ **<u>ග්‍රාම නිලධාරි මහතාගෙන්</u>** ලබා ගත් වාර්තාව **(මෙහි සඳහන් අදාළ අනෙකුත් ලේඛන සම්පූර්ණ කර ගැනීමෙන් පසු ග්‍රාම නිලධාරි වාර්තාව ලබා ගත යුතු අතර, එහි තොරතුරු සහ අයදුම්පතෙහි තොරතුරු එක හා සමාන විය යුතුය,**
3. **<u>පදිංචි ග්‍රාම නිලධාරි</u>** විසින් සහතික කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයෙහි සත්‍ය පිටපත
4. වෙළඳ බලපත්‍රය (අදාල වර්ෂය සඳහා **<u>මහරගම නගර සභාව</u>** විසින් නිකුත් කරනු ලබන)
5. ව්‍යාපාර අයිතිකරුගේ/අයිතිකරුවන්ගේ පදිංචිය, ව්‍යාපාර තිබෙන ග්‍රාම නිලධාරී වසමෙන් පරිබාහිර වසමක නම් එම වසමෙහි ග්‍රාම නිලධාරී මගින් ලබා ගත් පදිංචි සහතිකය.
6. **<u>හවුල් ව්‍යාපාරයක්</u>** නම් එහි හවුල් ගිවිසුමක් ඇතොත් එහි පිටපතක්.
7. **<u>හවුල් ව්‍යාපාරයක්</u>** නම් , ඉල්ලුම්පත්‍රය මගින් ප්‍රකාශිත තොරතුරු සනාථ කිරීම සඳහා සියලුම හවුල්කරුවන් විසින් වෙන වෙනම ඉදිරිපත් කරනු ලබන විධිමත් දිවුරුම් ප්‍රකාශයක් **( සාමදාන විනිශ්චයකරු / දිවුරුම් කොමසාරිස් සහතික කරන ලද)**
8. ව්‍යාපාර ස්ථානයේ හිමිකම සනාථ කිරීම සඳහා **<u>ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද</u>** ව්‍යාපාර ස්ථානයේ මුල් ඔප්පුව හෝ බදු ඔප්පුව හෝ බදු ගිවිසුම **<u>නොතාරිස්වරයෙකු</u>** සහතික කරන ලද පිටපත
   - ව්‍යාපාර ස්ථානයේ අයිතිය ඔප්පුවක් මගින් වෙනත් අයෙකුට හෝ ජීවිත භුක්තියකට හෝ පවරා ඇත්නම් නම් ( සැමියාට / බිරිඳට / මවට /පියාට/සහෝදරියට /සහෝදරයාට / දුවට /පුතාට ) එම ව්‍යාපාරය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ඔවුන්ගේ කැමැත්ත ප්‍රකාශ කරන ලද දිවුරුම් ප්‍රකාශය / ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතු අතර මියගොස් ඇත්නම් මරණ සහතිකයේ සත්‍ය පිටපත
   - වෙනත් අයෙකුට අයත් ස්ථානයක ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන්නේ නම්, ව්‍යාපාරය පවත්වාගෙන යාමට අවසර ලබා දී ඇති **<u>ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද</u>** බදු ඔප්පුව පිටපත **<u>නොතාරිස්වරයෙකු</u>** විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුය.
   - **<u>ප්‍රකාශන ඔප්පුවක්</u>** පවතින අවස්ථාවකදී ඔප්පුව පිටපත **<u>නොතාරිස්වරයෙකු</u>** විසින් සහතික කර ඉදිරිපත් කළ අතර අවුරුදු 10ක පදිංචිය තහවුරු කරන ග්‍රාම නිලධාරී වාර්තාව ( DS 04 ) ඉදිරිපත් කල යුතුය.
   - ඔප්පුව **<u>බැංකුවක හෝ මූල්‍ය ආයතනයකට</u>** උකස්කර ඇත්නම්, එම **මූල්‍ය ආයතනය** විසින් සහතික කරන ලද ඔප්පු පිටපතක් ඉදිරිපත් කළ යුතු අතර, අදාල ස්ථානයෙහි ව්‍යාපාරය සිදු කිරීම සම්බන්ධයෙන් **<u>එම ආයතනයෙහි</u>** කැමැත්ත ලිපිය ඉදිරිපත් කළ යුතුය.

9. **ව්‍යාපාර ස්වභාවය අනුව අවශ්‍ය වන අනෙකුත් ලියවිලි**

- ❖ ආහාර හා ආහාර ආශ්‍රිත නිෂ්පාදන, පිරිසිදුකාරක ද්‍රව්‍ය හා කෙමිකල් - මහජන සෞඛ්‍ය පරික්ෂක වාර්තාව (**PHI**)
- ❖ තේ කොළ පැකට් කිරීම (තේ කොළ ලබා ගන්නා ආයතනයේ ලිපිය, මහජන සෞඛ්‍ය පරික්ෂක වාර්තාව (**PHI**) / තේ කොළ නිෂ්පාදන SRILANKA TEA BOARD අනුමැතිය
- ❖ **ONLINE** ක්‍රම ඔස්සේ කරන ව්‍යාපාර අයිතිකරුගේ නමට පොලිස් වාර්තාව
- ❖ ෆාමසි, ඖෂධ නිපදවීම හා බෙදාහැරීම, බටහිර වෛද්‍ය මධ්‍යස්ථාන ,උපස්ථානය ආදි සෞඛ්‍ය සම්බන්ධ - සහතික කරන ලද ඖෂධවේදී සහතික පිටපත සහ සේවය කිරීමට කැමති බවට දිවුරුම් ප්‍රකාශය, බස්නාහිර පළාත් නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය, ලියාපදිංචි බටහිර වෛද්‍යවරයන්ගේ සහතිකය සහ පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන කොමිෂන් සභා නිර්දේශය.(සියලු පිටපත් සහහතික කළ යුතුයි )

අඩු පාඩු සහිත අයදුම්පත් භාර නොගන්නා බව කාරුණිකව දන්වමු .

- ❖ ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන, පංචකර්ම මධ්‍යස්ථාන - ලියාපදිංචි වූ ආයුර්වේද වෛද්‍යවරයන්ගේ සහතික පිටපත් සහ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නිර්දේශය. .( සියලු පිටපත් සහහතික කළ යුතුයි )
- ❖ නවාතැන් පහසුකම් සැපයීම /හෝටල් - පොලිස් වාර්තාව සහ මහජන විරෝධයක් නොමැතිබවට ග්‍රා.නි වර්තාව , මහජන සෞඛ්‍ය පරීක්ෂක වාර්තාව , පරිසර වාර්තාව
- ❖ රූපලාවන්‍ය ක්ෂේත්‍රය - **NVQ** හෝ රජයේ පිළිගත් ආයතනයකින් ලබා ගත් පුහුණු සහතිකවල සහතික කරන ලද පිටපත් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක වාර්තාව **(PHI)**
- ❖ සේවා සැපයීම් සිදු කරන ව්‍යාපාර (අධ්‍යාපන, , සංචාරක, මාර්ගෝපදේශ, ඉදිකිරීම් හා වාස්තු, විද්‍යා, පරිගණක, නඩත්තු, අලුත්වැඩියා හා ඉංජිනේරු සේවා ඇතුළු විවිධ වෘත්තීන්) - සහතික කරන ලද අදාළ සුදුසුකම් සහතික පිටපත් ඉදිරිපත් කළ යුතුයි .
- ❖ ඉදිකිරීම් ක්ෂේත්‍ර - සහතික කරන ලද ඉදිකිරීම් ක්ෂේත්‍රය හා සම්බන්ධ පුහුණු සහතික පිටපත් ඉදිරිපත් කළ යුතුයි.
- ❖ දැව ආශ්‍රිත ව්‍යාපාර (ලී වෙළඳසැල්, වඩු මඩු, ලී මඩු, ගෘහ භාණ්ඩ වෙළඳසැල්) - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිර්දේශය
- ❖ වාහන අලුත්වැඩියා, ලොන්ඩ්‍රි, ගරාජ්, යකඩ වැඩපලවල්, වැල්ඩින් , ඇලුමිනියම් , පොලිතින් , ප්ලාස්ටික්, බතික් වැඩ , සබන් , බේකරි , ඇඟළුම් ආශ්‍රිත කර්මාන්ත - පරිසර වාර්තාව (මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය - **0718418074 සංජීය මයා** )
- ❖ කෘෂිකර්ම හා සම්බන්ධ ව්‍යාපාර - පලිබෝධ නාශක අලෙවි කිරීමේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය / කෘෂිකර්ම උපදේශක නිර්දේශය.
- ❖ ප්‍රවාහන සේවා - අයිතිකරුගේ නමට ඇති වාහන පොත් වල සහතික පිටපත් සහ වාහන ලබාදෙන අයගේ කැමැත්ත ප්‍රකාශිත දිවුරුම් ප්‍රකාශය.
- ❖ මුද්‍රණාල ලියාපදිංචිය සඳහා - ජාතික ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් නිර්දේශය ලබන දිවිරුම් ප්‍රකාශය
- ❖ පෙර පාසැල් සඳහා - බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පෙර සාසල් ඒකකයේ (බ.ප) නිර්දේශය
- ❖ භාණ්ඩ කුලියට දීම (හට්,පුටු,මැෂින් ආදිය) - ග්‍රාම නිළධාරි සහතික කළ භාණ්ඩ ලැයිස්තුව
- ❖ යම් ආයතනයක වෙළඳ නියෝජිතයෙකු ලෙස කටයුතු කරන්නේ නම් අදාළ ආයතනයෙන් ලබාගත් ලිපිය
- ❖ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත සඳහා - මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ බලපත්‍රය ( මැණික් අලෙවිය / කැපීම / මැණික් ගැරීම හා අපනයනය වැනි )
- ❖ ආරක්ෂක සේවය සඳහා - ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය හා අයිතිකරුගේ නමින් ලබා ගත් පොලිස් වාර්තාව
- ❖ රියදුරු පාසැල් සඳහා - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් රියදුරු පාසලක් ලෙස ලියාපදිංචිය සඳහා සුදුසුකම් සපුරා ඇති බවට නිකුත් කරනු ලබන සහතිකය
- ❖ සේවා හා ශ්‍රමිකයන් සපයන ස්ථාන සඳහා - ව්‍යාපාර අයිතිකරුගේ නමින් ලබා ගත් පොලිස් වාර්තාව ,සේවය කරන අයගේ කැමැත්ත ප්‍රකාශිත දිවුරුම් ප්‍රකාශය,ජාතික හැඳුනුම්පත් පිටපත්

<u>ඉහත සුදුසුකම් අවශ්‍ය කරන ව්‍යාපාර වලට අදාළ සුදුසුකම් ව්‍යාපාර අයිතිකරුගේ නමට නොමැති නම්,</u>

- ❖ එම සුදුසුකම් සම්පූර්ණ කර ඇති පුද්ගලයෙකු එම ව්‍යාපාරයේ සේවය කිරීමට කැමැත්ත ප්‍රකාශිත දිවිරුම් ප්‍රකාශයක් අත්සන් කර සහතික කරන ලද අදාළ සුදුසුකම් සහතික වල පිටපත් හා හැඳුනුම්පතේ සහතික කළ පිටපතක් අවශ්‍ය වේ.

10. ව්‍යාපාරය ලියාපදිංචිය සඳහා ගාස්තු අය කිරීම.

- තනි/ හවුල් ව්‍යාපාර -ආරම්භක ප්‍රාග්ධනය රු.299,999 දක්වා. - රු.1,500.00
- තනි/ හවුල් ව්‍යාපාර - ආරම්භක ප්‍රාග්ධනය රු499,999 දක්වා. - රු.2,500.00
- තනි/ හවුල් ව්‍යාපාර - ආරම්භක ප්‍රාග්ධනය රු.500,000ට වැඩි . - රු.3,500.00
- ප්‍රමාද ගාස්තු - ව්‍යාපාරයක් ආරම්භ කර මාසයක් ඇතුළත ලියාපදිංචිය සඳහා කාර්යාලය වෙත භාරදිය යුතුය. එසේ නොමැති නම් ව්‍යාපාරයේ ආරම්භක දිනයේ සිට අයදුම්පත් භාර දුන් දිනය දක්වා කාලසීමාවට මසකට රු.500.00 බැගින් අය කරනු ලැබේ .

11.ආරම්භක දිනය 2013.10.01 පසු දිනයක් යෙදිය හැකි අතර ඊට අදාළව සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි හරහා ලේඛන ඉදිරිපත් කලයුතුය.

**Web – www.bnr.wp.gov.lk**